# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## තෙවන වාර අවසාන නිපුණතා අනාවරණ පරීක්ෂණය - 2019

## මව්බස

නම / අංකය : .......................................... 4 ශ්‍රේණිය ....... කාලය පැය 01 යි මිනිත්තු 15 යි.

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. පහත දී ඇති ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

'මම ගල් පරයක ඇලී ජීවත් වුණෙමි. ගලේ සෑදෙන පෙඳ සෙවෙල් මට ආහාර විය. මගේ දිවෙන් ගලේ පෙඳ සෙවෙල් පීරිගාගෙන කෑමට මම රෑ කාලයේ ඇවිද්දෙමි. කෑම සෙවීමට කොතැනකට ගියත් ආපසු පළමු සිටි තැනට ම යාම මගේ සිරිත යි. කාටවත් හිංසාවක් පීඩාවක් නොකොට ගල උලා  කමින් ජීවත් වන නමුත් මටත් මගේ ජාතියේ අනික් ඇත්තන්ටත් බොහෝ සතුරෝ සිටිත්. ඇතැම් පක්ෂීහු අහසින් බැස තුඩෙන් ඇන අප ගසා ගෙන ඉගිළ යෙති. ගලක් උඩ තියාගෙන මස් ටික කා අපගේ පොතු බිම දමති. කකුළුවා ද අපේ සතුරෙකි. ඌ රෑ කාලයේ අප සොයා ඇවිත් අඬුවලින් අල්වා ඇද ගලවා කට දික් කොට මස් ටික කා දමයි. බූවල්ලා ද අපේ සතුරෙකි. මොවුන් හැර තවත් අපට බොහෝ සතුරෝ සිටිති. මා මරා මදය කෑවේ බූවල්ලෙකි.'

I. ඡේදයේ  සඳහන් සත්ත්වයා ජීවත් වන්නේ කොහේද?

.......................................................................................................

II. එම සත්ත්වයා ආහාර සොයා ගියේ කෙසේද?

.......................................................................................................

III. සත්ත්වයාට සිටින සතුරන් දෙදෙනෙක් ලියන්න.

..........................................   ..........................................

IV. ඡේදයේ සඳහන් අප්‍රාණවාචී ඒක වචන නාම පද දෙකක් උපුටා ලියන්න.

.......................................................................................................

.......................................................................................................

V. "මම ගල්පරයක ඇලී ජීවත් වුණෙමි." මෙම වාක්‍ය බහු වචනයට හරවා ලියන්න.

.......................................................................................................

VI. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

- මෙහි සඳහන් සත්ත්වයාගේ අහාරය .......................................................... (කුඩා මසුන් / පෙඳසෙවෙල) විය.
- තුඩෙන් ඇන ගලක් උඩ තබාගෙන මස් කන්නේ ........................................ (බූවල්ලා/ පක්ෂීන්) ය.

(2 x 6=12)

2. අක්ෂර වින්‍යාසය නිවැරදි පදය තෝරා රවුම් කරන්න.

| | | |
|---|---|---|
| I. පෝෂණය | ● පෝශණය | ● පෝෂනය |
| II. දේෂනය | ● දේශණය | ● දේශනය |
| III. වෙළඹ | ● වෙලඹ | ● වෙළබ |
| IV. විකාෂනය | ● විකාෂණය | ● විකාශනය |
| V. ලක්ශන | ● ලක්ෂණ | ● ලක්ශණ |

(1 x 5= 5)

3. යුගල පදයේ අඩු වචන හිස්තැනෙහි ලියන්න.

I. ගෙවල් ..........................................

II. ................................................ පිටි

III. ....................................... සෙල්ලම්

IV. පොත් ...........................................

V. යාන .............................................

(1 x 5= 5)

4. පහත දැක්වෙන්නේ පෞද්ගලික ලිපියක ආකෘතියකි. කොටුව තුළ ඇති පිළිතුරු, නිවැරදිව තෝරා හිස්තැන්වල ලියන්න.

| |
|---|
| ආමන්ත්‍රණය, ආශිර්වාදය, වේලාව<br>ස්ථානය, අවසානය, දිනය |

A ..........................................

B ..........................................

C..........................................

D ..........................................

කරුණු ලිවීම.

E ..........................................

(1 x 5= 5)

5. පහත සඳහන් වාක්‍ය වල යෙදී ඇති පුරුෂ ලිංග නාම පද වෙනුවට ස්ත්‍රී ලිංග නාම පද යොදා වගන්ති නැවත ලියන්න.

I. මෙහෙකරුවා මහන්සි වී වැඩ වැඩ කළේය.

.....................................................................................

II. කතුවරයා පොතක් ලියයි.

.....................................................................................

III. නිවේදකයා වේදිකාවට පැමැණියේය.

.....................................................................................

IV. ඔහු බොරු නොකියයි.

.....................................................................................

V. මල්ලිලා සෙල්ලම් කළෝය.

.....................................................................................

(2 x 5= 10)

6. ඉඟි වැකියට ගැළපෙන අර්ථය සොයා යා කරන්න.

I. ඉහේ මලක් පිපුණා •
II. මොර සූරන වැස්ස •
III. එක හුස්මට •
IV. අනූනවයෙන් බේරුණා •
V. අකුරක් නෑර •

- යම්කිසි කාර්යයක් අවසන් වනතුරු නොනවත්වා කිරීම.
- කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීමයි.
- දැඩි සතුටට පත්වීමයි.
- යම් විපතකින් යාන්තමින් ගැළවීමයි.
- අධික වර්ෂාවයි.

(1 x 5= 05)

7. සුදුසු පරිදි විරාම ලක්ෂණ යොදන්න.

I. මේ ඔයාලගෙ පොත්ගුල
II. බට්ටන් මූදට ලැබෙන්නේ කෙසේ ද
III. පොතක් ලබාගෙන ගෙදර යන්න ඕනෑ නම් ඒකටත් අවසර තියෙනවා
IV. වාසනා වේවා

(1 x 5= 05)

8. දී ඇති වාක්‍ය ඒක වචන අතීත කාල නම් ඊට ඉදිරියෙන් (✓) ලකුණත්, බහු වචන අතීත කාල නම් ඊට ඉදිරියෙන් (✓) ලකුණත් යොදන්න.

| වාක්‍යය | ඒක වචන අතීත කාල | බහු වචන අතීත කාල |
|---|---|---|
| හාවා පැන පැන ගියේය. | ✓ | |
| තාත්තලා වැඩට ගියහ. | | |
| ක්‍රීඩකයෝ ක්‍රීඩා පිටියට පැමිණියෝය. | | |
| වඳුරා ගස් උඩ පැන පැන නැටුවේය. | | |
| අම්මලා කෑම සෑදූහ. | | |
| යහළුවෝ සෙල්ලම් කළෝය. | | |

(1 x 5= 05)

9. පළමු වන වාක්‍ය දෙස බලා, ඊට ගැළපෙන දෙවන වාක්‍ය වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.

I. ගුරුතුමිය කතන්දරයක් පැවසුවාය.

.......................................................................

II. මලිත සහ ගයනි පුස්තකාලයට ගියහ.

.......................................................................

III. අයියා උදෑසනින්ම පාසලට ගියේය.

.......................................................................

IV. නැන්දා කුස්සියට ගියාය.

.......................................................................

V. කුරුල්ලා අත්තක වැසුවේය.

.......................................................................

(ඔහු පන්තිය පිරිසිදු කළේය/ ඈ රස කෑමක් සෑදුවාය/ ඌ මිහිරි හඬින් නාද කළේය/ ඔවුහු පොත් කියවූහ/ ඈ කතන්දරය ඇසුරින් ප්‍රශ්න ඇසුවාය)

(2 x 5= 10)

10. ඉරි ඇඳි පදයට විරුද්ධ අර්ථය දෙන පදය හිස්තැනෙහි ලියන්න.

I. මේ බඳුන **දිරන** කසල දැමීමට **සුදුසුය.**

මේ බඳුන .......................... කසල දැමීමට .........................................ය.

II. ඔවුහු **යහපත්** ලෙස ක්‍රියා කිරීම **ආරම්භ** කළෝය.

ඔවුහු .......................... ලෙස ක්‍රියා කිරීම .............................. කළෝය.

III. එම චිත්‍රය ඉතාමත් **ලස්සනයි.**

එම චිත්‍රය ඉතාමත් ..............................................................................

(1 x 5= 05)

11. පෙළ පොත ඇසුරින් පිළිතුරු ලියන්න.

I. "පලක් නැති දේ කතා කිරීම ඇඟට ගුණ නෑ."

කීවේ කවුද?

..........................................................................................

පාඩම කුමක්ද ?

..........................................................................................

II. "ඔයාලා කැමති එහෙමද?"

කීවේ කවුද?

..........................................................................................

පාඩම කුමක්ද ?

..........................................................................................

III. "ඇයි මට කිව්වනෙ මාරපන යන්න කියලා"

කීවේ කවුද?

..........................................................................................

පාඩම කුමක්ද ?

..........................................................................................

(1 x 6 = 6 )

12. පහත දැක්වෙන වාක්‍ය ලිඛිත බසට හරවා නැවත ලියන්න.

I. මම ගමට යනවා.

..........................................................................................

II. අපි අන් අයට උදව් කරනවා.

..........................................................................................

III. මලිත් සහ ප්‍රබෝධි සමබල ආහාර වේලක් ගත්තා.

..........................................................................................

IV. ඇතා කොළ අතු ආහාරයට ගත්තා.

..........................................................................................

V. කොකා වෙල අද්දර සිටගෙන සිටියා.

..........................................................................................

(1 x 5= 5)

13. අල්ප ප්‍රාණ අක්ෂර හා මහප්‍රාණ අක්ෂර සහිත වචන රවුම තුළින් තෝරා වගුවේ ලියන්න.

එලය
ප්‍රතිමාව
ධමනිය
දර්ශනය

| අල්ප ප්‍රාණ අක්ෂර සහිත වචන | මහප්‍රාණ අක්ෂර සහිත වචන |
|---|---|
| | |
| | |
| | |

(1 x 4= 4)

14. පහත දැක්වෙන්නේ තේරවිල්ලක පිළිතුරු කවියකි. එහි හිස්තැන් පුරවන්න.

ඉණේ තිබෙ ලිය හැඹිලිය නොවේ දෝ

..........................................................................

..........................................................................

අතු අග තිබෙන ලිය අරලිය නොවේ දෝ (2 x 2= 4)

15. ඉහත තේරවිල්ල තේරවිලි කවි වර්ගයට අයත් වේ. වෙනත් තේරවිලි වර්ග දෙකක නම් ලියන්න.

.............................................................. ..............................................................

16. 'ජලය අපට සම්පතකි' යන මාතෘකාව යටතේ වාක්‍ය 05ක් ලියන්න.
(අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු අතර වාක්‍ය ලිඛිත බසින් ලිවිය යුතුය.) (1 x 2= 2)

I. ..........................................................................................................................................

..........................................................................................................................................

II. ..........................................................................................................................................

..........................................................................................................................................

III. ..........................................................................................................................................

..........................................................................................................................................

IV. ..........................................................................................................................................

..........................................................................................................................................

V. ..........................................................................................................................................

..........................................................................................................................................

අක්ෂර වින්‍යාසය සඳහා - 01
නිවැරදි පැහැදිලි අකුරු - 01
සඳහා හිමි වේ. (2 x 5= 10)